**ශීර්ෂ 156 -යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව 2014 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------------------

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන**

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව/ ආයතනය |
|---|---|
| 215 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව |
| - | ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය |
| - | තරුණ සුභසාධක අරමුදල |
| - | ජාතික යෞවන තිළිණ අධිකාරිය |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුව පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 156 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 2015 ඔක්තෝබර් 30 |
| 215 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 2015 ඔක්තෝබර් 23 |
| - | ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය | 2015 ඔක්තෝබර් 30 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරීන්ගේ වගකීම**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2 ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 10,081.92 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 9,042.58 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.මිලියන 996.83 ක් හා රු.මිලියන 42.50 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11.6 ක් හා සියයට 2.8 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 156 | 8,538.43 | 7,541.59 | 996.83 | 11.6 |
| 215 | 1,543.49 | 1,500.99 | 42.50 | 2.8 |
| **එකතුව** | **10,081.92** | **9,042.58** | **1,039.33** | **10.3** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15601 | 22.00 | 21.68 | 15.00 | 20.20 | 100.00 | 59.51 |
| 21501 | 50.00 | 32.58 | 45.00 | 55.42 | 220.00 | 122.09 |

## 2.3 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 3.67 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 7002/0000/00/0334/0014/000 | 1.03 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 7002/0000/00/0274/0014/000 | 2.64 |
| **එකතුව** | | **3.67** |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවෙහි 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 61.94 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0066/000 | 38.48 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0096/000 | 23.46 |
| **එකතුව** | | **61.94** |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 7 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

# 3. ශීර්ෂ 156 - යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

## 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති කාර්යාලය හා ජාතික යොවුන් සේනාංකය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | චෙක්පත් තැපැල් කිරීමේ හා අතට භාරදීම පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනය | මුදල් රෙගුලාසි 388 හා 389 |
| (iii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

**3.2 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 10 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.815,418,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 07 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.8,475,000 ක ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.7,295,000 ක් වි තිබුණු අතර එය සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 78 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වි තිබුණි.

(ඇ) වැය විෂයයන් 08 ක් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.11,344,699 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.939,286 ක තැන්පතු 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 15601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා පරාසයක කාලයක සිට පැවැත එන එකතුව

රු.1,273,104 ක හිඟ හිටි ශේෂ 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 06 කට වැඩි කාලයක සිට පැවැත එන සේවය අවසන් කළ නිලධාරීන් දෙදෙනකුගෙන් අයවිය යුතු එකතුව රු.363,795 ක ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

ලෝක තරුණ සමුළුව වෙනුවෙන් හම්බන්තොට පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළු කාර්යාලය ඉදිකිරීමට අමාත්‍යාංශය විසින් රු.2,087,950 ක් වැය කර තිබුණි. එම කාර්යාලය 2015 සැප්තැම්බර් 14 දින වන විටත් තරුණ කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවැතුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් මෝටර් වාහන 19 ක් අවිධිමත් ලෙස පහත සඳහන් බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණි.

| වත්කම් වර්ගය | සංඛ්‍යාව | වත්කම් ලබාදී තිබුණු ආයතනය |
|---|---|---|
| මෝටර් වාහන | 01 | තැපැල් සේවා අමාත්‍යාංශය |
| | 07 | අධ්‍යාපන සේවා අමාත්‍යාංශය |
| | 02 | වෘත්තීය පුහුණු අධිකාරිය |
| | 05 | ජාතික යොවුන් සේනාංකය |
| | 01 | ජාතික තරුණ සේවා සභාව |
| | 01 | ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය |
| | 02 | සාගර විශ්ව විද්‍යාලය |

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

-----------------------------------------------------------

වෙනත් ආයතන සතුව තිබුණු මෝටර් රථ විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් අයිති ආයතනය | ප්‍රමාණය | භාවිතා කරන කාලය |
|---|---|---|---|
| | | | වර්ෂ |
| මෝටර් වාහන | ජාතික තරුණ සේවා සභාව | 2 | 2 |
| | තැපැල් සේවා අමාත්‍යාංශය | 1 | 4 |

**(ඈ) පවරා නොගත් ගොඩනැගිලිවල නඩත්තු කටයුතු කිරිම**

-----------------------------------------------------------

ජාතික යොවුන් සේනාංකය විසින් වෙනත් පාර්ශවයන් සතුව තිබුණු ඉඩම්වල මධ්‍යස්ථාන 39 ක් පවත්වා තිබුණු අතර එහි නඩත්තු කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.39,465,432 ක් වැය කර තිබුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

--------------------------

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට වඩා අඩු කාලයක සිට පැවැත එන එකතුව රු. 17,036,882 ක බැරකම් පැවැතුණි.

## 3.6 අනුකූල නොවීම්

**නීති, රීති, හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ 2(4) වගන්තිය | යොවුන් සේනාංක සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණුව, යොවුන් සංවර්ධන හා ස්ථාපනය යන කාර්ය සඳහා කමිටු තුනක් පත්කර ඒ සඳහා බලතල පැවරීම යොවුන් සේනාංක සභාව විසින් ඉටු කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කමිටු යොවුන් සේනාංක සභාව විසින් පත්කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ** | |
| (i) මුදල් රෙගුලාසි 1646 | 2014 වර්ෂයට අදාළ ජාතික යොවුන් සේනාංකය සතු සංචිත වාහන 10 ක දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1647(ඉ) | යොවුන් සේනාංකය විසින් මෝටර් වාහන පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 103 හා 104 | ජාතික යොවුන් සේනාංකයට අයත් වාහන 2 කට සමාලෝචිත වර්ෂයේදී සිදුවූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | අමාත්‍යාංශය හා යොවුන් සේනාංකය සතු වාහන සම්බන්ධව මාස 06 කට වරක් ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |

**(ඇ) උපදේශකවරුන් බඳවා ගැනීමේ රජයේ මාර්ගෝපදේශ සංග්‍රහය**

| | | |
|---|---|---|
| (i) | 2.3.1 (සී) මාර්ගෝපදේශය | ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන් කාර්යාලය නවීකරණය කිරීම සඳහා වන ප්‍රසම්පාදනයට අදාළ උපදේශක සේවාවේ අවශ්‍යතාවය පිළිබඳව විස්තර වාර්තා (EOI) සකස් කර ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) | 3.5 මාර්ගෝපදේශය | ඉදිකිරීම් කටයුතුවල පිරිවැය රු.මිලියන 2 කට හෝ ඊට වඩා වැඩි ඉදිකිරීම් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මඟින් උපදේශකවරුන් තෝරාගත යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (iii) | 3.3 මාර්ගෝපදේශය | උපදේශක සේවාවෙහි අවශ්‍යතාවය පැහැදිලිවන පරිදි අවශ්‍ය තොරතුරු Terms Of Reference (TOR) සකස් කර නොතිබුණු අතර උපදේශක ගාස්තු පූර්වයෙන්ද තීරණය කර එකඟතාවයකට පැමිණ නොතිබුණි. |
| (iv) | 3.2 හා 4.4 මාර්ගෝපදේශ | උපදේශක සේවාව ලබාගැනීම ආයතනයට වාසිදායක වන පරිදි තරඟකාරී ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි. |
| (v) | 6.6.4 මාර්ගෝපදේශය | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක ප්‍රමාණයක් ගෙවිය හැකි වුවත්, එම සීමාව ඉක්මවා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 26 කට සමාන රු.177,580 ක් අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය මත උපදේශකට ගෙවා තිබුණි. මේ සඳහා ඇප සුරක්ෂණයක් හෝ ලබාගෙන නොතිබුණි. |

**3.7 විදේශාධාර වැඩසටහන**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූලාශ්‍රය යටතේ ක්‍රියාත්මක කළ නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ණය ගිවිසුම් අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 125,891 ක් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන 09 ක් විසින් එකතුව රු. මිලියන 9,592 ක් වැය කර තිබුණි.

එම වැඩසටහනින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ ආංශික නිපුණතා සංවර්ධන ඒකකයේ වියදම් පිළිබඳ සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) කුලියාපිටිය විශ්ව විද්‍යාල විද්‍යායතනය සම්බන්ධ ක්ෂේත්‍ර විගණන පරීක්ෂාව**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගොඩනැගිලි ඉදිකිරීමට යෝජිත ඉඩම් 2015 ජුනි 23 දින වන විටත් අමාත්‍යාංශයට පවරාගෙන නොතිබුණි.

(ii). අදාල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව හා උපදේශක සේවා ඉටු කිරීමේ කාර්යය සඳහා එකතුව රු.112,306,096 ක ගිවිසුම්ගත වටිනාකමකට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලබාදී තිබුණි. ඉදිකිරීම් නිමකළ ගොඩනැගිල්ලෙහි ප්‍රධාන අඩුපාඩු 04 ක් පැවැතුණි.

(iii). සමාලෝචිත වර්ෂය අවසන් වන විට විද්‍යායතනය හඳුන්වා දුන් පාඨමාලා 09 න් පාඨමාලා 05 ක අධ්‍යයන කටයුතු ආරම්භ කර නොතිබුණි. අධ්‍යයන කටයුතු ආරම්භ නොකළ පාඨමාලා 2 කට කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බඳවාගෙන තිබුණි. ආරම්භ කළ පාඨමාලා 2 ක් හැදෑරීම සඳහා සහභාගී වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 14 ක් වි තිබුණි. ඒ අනුව පාඨමාලා 2 කට බඳවාගත් කථිකාචාර්යවරුන් දෙදෙනකු සඳහා සිදු කළ වියදම, පාඨමාලාවන් 5 ක් සඳහා විද්‍යාගාර ඉදිකිරීමේ පිරිවැයද හා එකතුව රු.98,648,137 ක් වැය කර මිලදී ගෙන තිබුණු පුහුණු උපකරණද 2015 ජූලි මාසය වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

(iv). එක් පාඨමාලාවකට 2015 ජනවාරි 18 දින ලබාදුන් උපකරණ අයිතම 51 කින් වටිනාකම රු.1,349,227 ක උපකරණ අයිතම 31 ක් ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි.

(v). සමාලෝචිත වර්ෂයේ විද්‍යාගාර 04 කට ලබාදුන් උපකරණ සඳහා අවශ්‍ය විද්‍යාගාර සැකැස්ම, ජලය හා විදුලිය නිසි පරිදි සපයා නොතිබුණු බැවින් එම උපකරණ නිෂ්කාර්යව ගොඩ ගසා තිබුණි. ඉන් එක් පාඨමාලාවකට පමණක් සැපයූ භාණ්ඩවල වටිනාකම රු.2,070,000 ක් වී තිබුණි.

**(ආ) පුහුණු මධ්‍යස්ථාන සඳහා උපකරණ මිලදී ගැනීම**

ජාතික තරුණ සේවා සභාවට අයත් නවීකරණය කළ පුහුණු මධ්‍යස්ථාන 02 කට පුහුණු උපකරණ මිලදීගැනීමට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 40 ක ප්‍රතිපාදන විදේශාධාර වැඩසටහන යටතේ සළසා තිබුණි. ඒ අනුව ආයතන 14 කින් එකතුව රු.34,545,147 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනිම සඳහා ඇනවුම් කර තිබුණි. එසේ ඇණවුම් කළ භාණ්ඩ 2014 දෙසැම්බර් 20 දින වන විට සැපයිය යුතුව තිබුණත් 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම භාණ්ඩ සපයා නොතිබුණි. එසේ වුවත් භාණ්ඩ නියමිත ප්‍රමිතීන්ට අනුකූලව සපයා තිබුණු බවට සහතිකයකින් තොරව ගබඩා භාරකරු විසින් නිකුත් කළ සාවද්‍ය භාණ්ඩ ලැබීම් පත් (GRN) පදනම් කර ගෙන රු.21,029,057 ක් වටිනා ගෙවීම් වවුචර් සකස් කර නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන් ඒකකයට ඉදිරිපත් කර තිබුණි. එම ඒකකය විසින් භාණ්ඩ ලැබීම් පිළිබඳ තහවුරුවකින් තොරව 2015 ජනවාරි 21 දින රු.30,945,799 ක් සභාව වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි.

**(ඇ) මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය ඉදිරීම**

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ රු.117,018,871 ක් වැය කර රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ උපදේශක සේවාව යටතේ පෞද්ගලික ආයතනයක් විසින් මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය ඉදිකර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් 2014 දෙසැම්බර් 30 දින මෙම ඉදිකිරිම නිම කර අමාත්‍යාංශය වෙත භාර දී තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i). 2014 දෙසැම්බර් 29 දිනැති ලිපිය මඟින් ආයතනයේ කළමනාකරණය විසින් මෙම කොන්ත්‍රාත්තුවේ දෝෂ ලැයිස්තුවක් ව්‍යාපෘති කාර්යාලයට එවා තිබුණත් විගණන දිනය වූ 2015 මැයි 12 දින වන විටත් එම අඩුපාඩු නිවැරදි කර නොතිබුණි.

(ii). ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී එක් එක් පාඨමාලාවට අවශ්‍ය උපකරණ සවිකිරීමේ හැකියාව හා ඊට අවශ්‍ය ඉඩකඩ තිබේද යන්න පිළිබඳ අවධානය යොමු කර පාඨමාලා සඳහා අවශ්‍ය කරන විද්‍යාගාර සැකැස්මට අනුව කාමර

වෙන් කර නොතිබුණි. තවද එම විද්‍යාගාරවලට අවශ්‍ය උපකරණ තැබීමට රාක්ක, ජලය සහ විදුලි පරිපථ සකස් කර නොතිබීම හේතුවෙන් විගණන දිනය වන විටත් පාඨමාලා සඳහා මිලදීගත් උපකරණ සවිකර පුහුණු පාඨමාලාවන් පැවැත්වීමට නොහැකිවී තිබුණි.

(iii). පුස්තකාල පොත් 730 ක් මිලදීගෙන විශ්වවිද්‍යාල විද්‍යායතනයට එවා තිබුණත්, විගණන දින වන විට පොත් 475 ක් පමණක් ලැබී තිබුණු බව ව්‍යාපෘති කාර්යාලයෙන් වාර්තා කර තිබුණි.

(iv). අපේක්ෂිත ඉලක්කයන් ලඟා කරගැනීමට හා අඛණ්ඩව පාඨමාලා ආරම්භ කර පවත්වාගෙන යාමට අවශ්‍ය ඉඩ පහසුකම් සැලසෙන පරිදි ගොඩනැගිලි සැලැසුම් නොකිරීම හේතුවෙන් ඉදිකළ පන්ති කාමර, බඳවාගත් සිසුන්ට පමණක් ප්‍රමාණවත් වී තිබුණු අතර ඉදිරි වර්ෂයට අලුතෙන් ළමුන් බඳවා ගැනීම ගැටළු සහගත වී තිබුණි.

**(ඇ) නිෂ්පාදන තාක්ෂණවේදී පාඨමාලාවට අවශ්‍ය උපකරණ මිලදී ගැනිම**

ඉහත සඳහන් පාඨමාලාව සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂයේදී රු.186,138,494 ක භාණ්ඩ ඇනවුම් කර තිබුණි. ආසියානු සංවර්ධන බැංකු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ලිපියෙහි 60 පරිච්ඡේදයට අනුව සමාන ස්වභාවයේ උපකරණ එක කාණ්ඩයක් ලෙස වර්ගීකරණය කර ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය මඟින් මිලදී ගත යුතුව තිබුණි. එමෙන්ම ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම මත කරනු ලබන මිලදී ගැනීම් පමණක් අමාත්‍යාංශය මඟින් සිදුකළ යුතුව තිබුණි. ඊට පටහැනිව පුහුණු වැඩසටහන නමින් භාණ්ඩ කාණ්ඩ ගත කර ජාතික තරඟකාරී මිල කැඳවීම මඟින් අමාත්‍යාංශය විසින් මෙම මිලදීගැනීම සිදුකර තිබුණි. එහිදී පහත සඳහන් අඩුපාඩු සිදුවී තිබුණි.

(i) ලංසු කැඳවූ ඒකක 97 න් 35 කට ලංසු ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම ආයතන 05 ක් භාණ්ඩ කාණ්ඩ එකක් සඳහා පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව මෙම ප්‍රසම්පාදනය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

(iii) ලංසු ලේඛනවල ලංසු ඇගයීමේ කොන්දේසියක් ලෙස උපකරණ කාණ්ඩ කොටසකට පමණක් ලංසු ඉදිරිපත් කළ නොහැකි බව සඳහන් කර නොතිබුණත්, කොටසකට ලංසු මිල ඉදිරිපත් කළ සැපයුම්කරුවන්

ප්‍රතික්ෂේප කර තිබුණි. එහෙත් තෝරාගත් සැපයුම්කරු භාණ්ඩ කාණ්ඩ 97 කින් 62 කට පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි.

(iv) මිල ගණන් ඉදිරිපත් කළ වටිනාකම රු.186,138,494 ක භාණ්ඩ සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට හා මිල ගණන් නොලද භාණ්ඩ සඳහා නැවත මිල ගණන් කැඳවීමට තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබුණත්, මිල ගණන් ඉදිරිපත් නොකළ භාණ්ඩ සඳහා විගණන දිනය වූ 2015 ජූලි 10 දින වන විටත් නැවත මිල ගණන් කැඳවා නොතිබුණි.

(v) 2015 ජනවාරි 06 දින වන විට භාණ්ඩ සපයා සවි කිරීම හා පරීක්ෂණ සම්පූර්ණ කළ යුතුව තිබුණත්, එම කාලයද 2015 ජනවාරි 11 දින දක්වා දීර්ඝ කර තිබුණි. එදින වන විටත් උපකරණ සපයා නොතිබුණි

## 3.8 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.169,000,000 ක්වූ මාතර නිල්වලා යොවුන් උද්‍යානය ඉදිකිරීමේ කටයුතු 2011 වර්ෂයේදී අවසන් කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.7,657,349 ක් වැය කර තිබුණු අතර එම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි.

## 3.9 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තු හා ක්‍රියාකාරී සැලැසුම් අනුව අමාත්‍යාංශයේ හා කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකකය විසින් ක්‍රියාත්මක කර තිබුණු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 න් ඔබ්බට වන පශ්චාත් සංවර්ධන න්‍යාය පත්‍රයට තරුණයා ප්‍රධාන තේමාව බවට පත්කරමින් 2014 මැයි මස පැවැත්වූ ජාත්‍යන්තර තරුණ සමුළුවට එකතුව රු.647,197,048 ක් වැය කර තිබුණි. 2013 හා 2014 වර්ෂවලදී මූලික සැලැසුම් හා සංවිධාන කටයුතු සිදුකිරීමට පත් කළ 20 දෙනෙකුගෙන් යුත් ජාත්‍යන්තර කාර්යසාධන බලකාය විසින් ලෝක තරුණ සමුළුවේදී එළි දැක්වූ තරුණයා පිළිබඳ කොළඹ ප්‍රකාශනයෙහි ඉහත කී පරිදි තරුණයා ප්‍රධාන තේමාව බවට පත් කිරීමට අදාලව මූලික අරමුණු 10 කට මූලිකත්වය ලබාදී ක්‍රියාත්මක කළයුතු බවට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, අමාත්‍යාංශයේ තරුණ සංවර්ධන අංශයේ හෝ අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවල ක්‍රියාකාරී සැලැසුම් පිළියෙළ කිරීමේදී ඉහත කී

නිර්දේශ ඇතුළත් කර නොතිබුණු අතර එකී අරමුණු ඉටු වූවාද, යන්න පිළිබඳ පසු විපරම් කිරීමට විධිමත් වැඩ පිළිවෙලක්ද අමාත්‍යාංශය සතුව නොතිබුණි.

(ආ) කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් 2014 ව්‍යවසාය ප්‍රදර්ශනය සහ තිළිණ ප්‍රදාන උත්සවය පැවැත්වීමට සමාලෝචිත වර්ෂය තුළ නොහැකි වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී පුද්ගලයින් 23,540 ක් සහභාගී කරමින් පුහුණු වැඩසටහන් 755 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණු අතර වර්ෂය තුළ පුද්ගලයන් 45,606 ක් සහභාගී කරමින් වැඩසටහන් 1,141 ක් පවත්වා තිබුණි. ඒ අනුව වැඩසටහන් පැවැත්වීමේ හා පුද්ගලයින් සහභාගී කරවීමේ ප්‍රගතිය පිළිවෙළින් සියයට 151 ක් හා සියයට 226 ක් විය. ඊට සාපේක්ෂව මූල්‍ය ප්‍රගතිය සියයට 26 ක් වී තිබුණි. සියළුම වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය සියයට 100 ඉක්මවා තිබුණු අතර වැඩසටහන් 2 ක පමණක් සියයට 100 කට අඩු සහභාගීත්වයක් තිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී හා කාර්යසාධන ඉලක්කයන් තීරණය කිරීමේදී පවතින භෞතික හා මානව සම්පත් පිළිබඳ නිවැරදි තක්සේරුවක් නොමැති වීම ඉහත තත්ත්වයට හේතුවී තිබුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු විධිමත් බවින් තොර වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

(අ) ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘති කාර්යාලය නවීකරණය හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂයේදී රු.24,592,115 ක් වැය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම කටයුත්තට අදාල සමාන අයිතම් එකට ගෙන වර්ගීකරණය කිරීමෙන් තොරව හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව පිළිගත හැකි පදනමකින් තොරව සීමිත මිල ගණන් කැඳවීමෙන් සිදුකර තිබුණි.

(ii) සීමිත මිල ගණන් කැඳවීමට ආයතන 09 ක් තෝරාගෙන තිබුණද, එම ආයතන තෝරාගත් ආකාරය පිළිබඳ විස්තර ලිපිගොනු තුළ නොතිබුණු අතර මිල ගණන් ලියාපදිංචි තැපැල් මඟින් ලබාගත් බව තහවුරු කර නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික පිරිවිතර සැලැසුම් ආදිය ඇතුළු ලංසු කැඳවීමේ ලේඛන (Bid document) පිළියෙළ කර නොතිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සියලු ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

(v) සමාන අයිතම් එකට ගෙන විශේෂ නිපුණතා ඇති ආයතන අතුරින් තරඟකාරී ලෙස ප්‍රසම්පාදනය සිදු නොකිරීම හේතුවෙන් සම්පූර්ණ අයිතම සඳහා මිල ගණන් ආයතන දෙකකින් පමණක් ලැබී තිබුණි.

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයිය යුතු භාණ්ඩ හෝ සේවා ප්‍රමාණයක් හෝ පිරිවිතරයන් ලංසු ලේඛනවල දක්වා නොතිබුණි.

(vii) 2014 මාර්තු 31 දිනට පෙර නවීකරණ කටයුතු නිමකළ යුතු බවට හේතු දක්වමින් සීමිත මිල ගණන් කැඳවා තිබුණත්, ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් නිම කළ යුතු දිනයන් අදාල දිනට වඩා මාස 1 ක සිට මාස 2 ක් දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.

(viii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 (අ) වගන්තිය ප්‍රකාරව සියළුම ලංසුකරුවන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ලංසු සුරක්ෂණ ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ix) 2014 මාර්තු 11 හා 12 දිනවල මීට අදාල තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එක් කටයුත්තක් සඳහා සාම්පල් ඉදිරිපත් නොකිරීම හා තවත් ප්‍රසම්පාදන කාර්යයන් 2 ක මිල ගණන් ඉතා අධික වීම මත එම ලංසු ඇගයීම් සිදු කර නොතිබුණි. 2014 මාර්තු 31 දින ඉහත කී තාක්ෂණික ඇගයීම් කමිටුව වෙනුවට වෙනත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් හේතු දැක්වීමකින් තොරව පත්කර තිබුණු අතර එම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පූර්වයෙන් අනුමත නොකළ ආයතන 3 කින් ලැබුණු එකතුව රු.5,738,364 ක ප්‍රසම්පාදන නිර්දේශ කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව ව්‍යාපෘති කාර්යාලයට පුද්ගලික ආයතනයකින් රු.4,326,791 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ පළමු මහලේ තිබුණු ආපන ශාලාව නවීකරණය හා වැඩිදියුණු කිරීමට සමාලෝචිත වර්ෂයේදී රු.22,788,402 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.1(අ) හා 4.3.1(අ) මාර්ගෝපදේශ ප්‍රකාරව පිළිවෙලින් තාක්ෂණික පිරිවිතර හා සැලැසුම් ඇතුළත් විධිමත් ලංසු කැඳවීමේ ලේඛන හා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අමාත්‍යාංශය විසින් සකස් කර නොතිබුණි.

(ii) එම ප්‍රසම්පාදනයට ගොඩනැගිලි ඉදිකිරීම හා ලී බඩු සැපයීමද ඇතුළත්ව තිබුණු අතර, එම කටයුතු සඳහා වෙන් වශයෙන් ලංසු කැඳවා නොතිබුණු බැවින් සම්පූර්ණ කාර්යයට එක් ආයතනයකින් පමණක් එක් ලංසුවක් ඉදිරිපත් කර තිබුණි.

(iii) ක්ෂේත්‍රය පිළිබඳ නිපුණතාවයක් තිබුණු ආයතන 2 ක් වායු සමීකරණ යන්ත්‍ර සැපයීමට පමණක් මිල ගණන් ලබාදී තිබුණු අතර එම මිල රු.මිලියන 1.8 කින් පමණ අඩු අගයක් විය. තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව මෙම මිල ගණන්වල විෂමතාවය පිළිබඳ ඇගයීමකින් තොරව උක්ත සැපයුම්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.18 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව එකතු කළ අගය මත බදු වෙන් වශයෙන් සඳහන් කිරීමට ලංසුකරුවන්ට උපදෙස් ලබාදිය යුතු වුවද, එසේ නොකර පසුව එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ලෙස රු.3,584,406 ක් සඳහන් කර එවා තිබුණු ලිපිය ආයතනය පිළිගෙන තිබුණි.

(ඈ) ජාතික යොවුන් සේනාංකයේ පුහුණු මධ්‍යස්ථාන 16 ක ගොඩනැගිලිවල තීන්ත ආලේප කිරීම සඳහා රු.8,543,848 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) වර්ණාලේප කිරීමට අපේක්ෂිත වර්ග අඩි ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කර නොතිබුණි.

(ii) මිල ගණන් ඇගයීමට පදනමක් නොතිබුණු අතර අවම මිල මත පදනම්ව කොන්ත්‍රාත් ප්‍රදානයට තීරණ ගෙන තිබුණි. එමෙන්ම එක් එක් කොන්ත්‍රාත්කරුවන් එකම කාර්යයට ඉදිරිපත් කළ මිල ගණන්වල වර්ග අඩියකට රු.7 ක සිට රු.24 ක් දක්වා පරාසයක වූ මිල ගණන් ඇගයීමේදී එම විචලනයන්ට හේතු පැහැදිලිව දක්වා නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුකරු විසින් ඉදිරිපත් කළ ලංසුව ප්‍රතිග්‍රහනය කළ පසු අමාත්‍යාංශය විසින් ලංසුකරු වෙත වහාම ප්‍රතිග්‍රහනය කළ ලිපියක් නිකුත් කර ඒ සමගම කොන්ත්‍රාත්තුව සඳහා විධිමත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, අවස්ථා 04 කදී මාස 1 සිට මාස 2 ක් දක්වා කාලයක් ප්‍රමාද කර කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 මාර්ගෝපදේශය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පිළියෙල කර එළඹ තිබුණු කොන්ත්‍රාත් ගිවිසුම්වල ඇතුළත් විය යුතු මූලික කරුණු 05 ක් ඇතුළත් කර නොතිබුණි.

## 3.11 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයට අයත් වාහන 05 ක් අනතුරට ලක් වීමෙන් එකතුව රු.372,630 ක ඇස්තමේන්තුගත අලාභ හානි සිදු වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත අනතුරු 5 න් 3 කින් රජයට වූ රු.259,580 ක අලාභය අදාළ රක්ෂණ ආයතනයෙන් හෝ අදාල වගකිවයුතු නිලධාරීන්ගෙන් හෝ අයකර ගත් බව විගණනයේදී තහවුරු වී නොතිබුණි.

(ii) අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(අ), (2) හා (3) ප්‍රකාරව පරීක්ෂණ පවත්වා නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 1647 ප්‍රකාරව අනතුරු සම්බන්ධයෙන් අනතුර සිදුවූ වහාම පොලීසියට වාර්තා කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 12 දින වාහනයකට සිදුවූ අනතුර සම්බන්ධයෙන් දින 14 ක් ප්‍රමාදව පොලීසියට වාර්තා කර තිබුණි. තවද එම අනතුර සම්බන්ධයෙන් ඉදිරිපත් කළ මූලික විමර්ශන වාර්තාවලට අනුව අළුත්වැඩියාවට වැය කළ මුදලට සමාන මුදලක් රක්ෂණ වන්දි ලැබුණු නිසා මෙම අනතුරෙන් රජයට අලාභයක් සිදු නොවූ බවට නිගමනය කර තිබුණද, මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර අනතුර සම්බන්දයෙන් වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) අළුත්වැඩියාවන් නිසි පරිදි සිදුකළ බව කාර්මික නිලධාරියෙකුගේ සහතිකයකින් සනාථ නර නොගෙන අමාත්‍යාංශය විසින් අවස්ථා 4 කදී එකතුව රු.456,918 ක වාහන අළුත්වැඩියා බිල්පත් පියවා තිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමේදී ඉදිරි වර්ෂයට ප්‍රමුඛතාවය ලබාදිය යුතු අයිතමයන් පිළිබඳව හා ප්‍රතිපාදන සීමාවන් පිළිබඳ අවධානය යොමුකර කාල විශ්ලේෂණයක් ඇතුළත්ව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. තවද පහත සඳහන් අඩුපාඩුව හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව හා ඵළදායීව සිදු කර නොමැති බව තහවුරු විය.

විගණන නියැදි පරීක්ෂාවට අනුව අමාත්‍යාංශයේ අංශ කිහිපයක් සඳහා අවස්ථා 3 ක දී වටිනාකම රු.323,676 ක පරිගණක 2 ක් හා ස්කෑනර් යන්ත්‍රයක්ද, අවස්ථා 03 කදී එකතුව රු.592,935 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර 05 ක්ද හා අවස්ථා 06 කදී වටිනාකම රු.305,899 ක කාර්යාල උපකරණ 06 ක්ද වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කර මිලදී ගෙන තිබුණි. නමුත් අවස්ථා ගණන එකට සිමා කර ජාතික තරඟකාරී ලංසු කැඳවීමක් කර පිරිවැය අවම කර ගැනීමේ අවස්ථාව කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමු කර නොතිබුණි.

(ඈ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනට අයත් වෑන් රථයක් 2014 දෙසැම්බර් 17 දින අනතුරකට ලක්වී තිබුණු අතර විගණන දිනය වූ 2015 මාර්තු 26 දින වන විටත් මුදල් රෙගුලාසි 104(1),(2) හා (3) ප්‍රකාරව පරීක්ෂණ පවත්වා නොතිබුණි. තවද මෙම අනතුරු සිදුවී තිබුණු බව පමණක් ගොනුවෙහි සඳහන් කර තිබුණු අතර වෙනත් කිසිදු තොරතුරක් වාර්තා කර නොතිබුණි. එමෙන්ම මෙම අනතුරට අදාල ඇස්තමේන්තුගත අලාභය රු.194,533 ක් වූ අතර එම මුදල 2015 අගෝස්තු 14 දින වන විටත් රක්ෂණ ආයතනය වෙතින් ප්‍රතිපූරණය කරවා ගෙන හෝ වගකිවයුත්තන්ගෙන් අයකර ගෙන හෝ නොතිබුණි.

## 3.12 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

**(i) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 52 | 34 | 18 |
| (ii) | තෘතියික මට්ටම | 181 | 134 | 47 |
| (iii) | ද්විතියික මට්ටම | 906 | 663 | 243 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 77 | 68 | 9 |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 6 | 1 | 5 |
| | **එකතුව** | **1,222** | **900** | **322** |

**(ii) ජාතික යොවුන් සේනාංකය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 3 | 3 | - |
| (ii) | තෘතියික මට්ටම | 5 | 5 | - |
| (iii) | ද්විතියික මට්ටම | 256 | 230 | 26 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 55 | 53 | 2 |
| (v) | කොන්ත්‍රාත් | 357 | 300 | 57 |
| | එකතුව | 676 | 591 | 85 |

ජාතික යොවුන් සේනාංකය පුහුණු මධ්‍යස්ථානයකට නියමිත කාර්ය මණ්ඩලය අධ්‍යයන නිලධාරීන් 10 දෙනෙකු හා අනධ්‍යයන නිලධාරීන් 4 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද, පුහුණු මධ්‍යස්ථානවල නිලධාරී පුරප්පාඩු 74 ක් පැවති අතර එම පුරප්පාඩු තුළ මධ්‍යස්ථාන 17 ක මධ්‍යස්ථානාධිපති තනතුරුද මධ්‍යස්ථාන 13 ක සහාය මධ්‍යස්ථානාධිපති තනතුරුද පුරප්පාඩුව පැවතුණි.

**(iii) කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකකය**

කුඩා ව්‍යාපාර සංවර්ධන ඒකකය අමාත්‍යාංශ විෂය පථය යටතේ පවතින වෙන්වූ ඒකකයක් වූ අතර එහි සියලුම කාර්ය මණ්ඩල ශ්‍රේණි ඇතුළත්වන පරිදි සකස් කළ අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබුණි. තෘතීයික මට්ටමේ ශ්‍රේණි ගත රැකියා සඳහා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය යොදවා තිබුණු බැවින් 2014 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| | සේවක වර්ගය | තථ්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 36 |
| (ii) | තෘතීයික මට්ටම | 101 |
| (iii) | ද්විතීයික මට්ටම | 38 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 6 |
| | **එකතුව** | **181** |

**(iv) ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | - |
| (ii) | තෘතියික මට්ටම | 5 | 3 | 2 |
| (iii) | ද්විතියික මට්ටම | 27 | 25 | 2 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 36 | 31 | 5 |
| | එකතුව | 69 | 60 | 09 |

**(ආ) නිලධාරීන් බඳවා නොගැනීම**

සමාලෝචිත වර්ෂය නිමවන විට නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂයකට ආසන්න කාලයක් ගත වී තිබුණත්, කළමනාකරණ මට්ටමේ අනුමත තනතුරු 20 න් පහත සඳහන් තනතුරු 05 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

| | තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) | වෘත්තීය මාර්ගෝපදේශ විශේෂඥ | 01 | 01 |
| (ii) | ගණකාධිකාරී | 02 | 01 |
| (iii) | ප්‍රසම්පාදන නිලධාරී | 02 | 01 |
| (iv) | සමාජ ආරක්ෂණ නිලධාරී | 01 | 01 |
| (v) | මානව සම්පත් සංවර්ධන නිලධාරී | 02 | 01 |

**4. ශීර්ෂ 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

**4.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2014 වර්ෂයෙන් පසු මිලදී ගත් වත්කම් පමණක් ඇතුළත් කර ලේඛනය සකස් කර ඇත. |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

**4.2 අයවැය විචලනය**

වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 44 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**4.3 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2ක් ඉක්මවූ එකතුව රු.1,141,615 ක් වූ තැන්පතු 25 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.4 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව රු. 3,724,570 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 18 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**4.5 යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**4.5.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණනය විසින් පෙන්වා දී තිබුණු ඌනතාවයන් නිවැරිදි කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණු අවස්ථාවන් පහත දැක්වේ.

(අ) අම්පාර තාක්‍ෂණ විද්‍යාලයේ 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්‍ෂණ වාර්තාව අනුව රු.647,911 ක භාණ්ඩ ඌනතාවයක් පැවැති නමුත් අදාල ගබඩා භාරකරුගෙන් එම අලාභය අයකර ගෙන නොතිබුණි.

(ආ) ඇඹිලිපිටිය, හසලක, අම්පාර හා සමන්තුරය තාක්‍ෂණ/කාර්මික විද්‍යාලවල බාහිර උපදේශකයින් බඳවා ගැනිමේදි සුදුසුකම් සනාථ කර සහතික පත් සත්‍ය පිටපත් ලෙස තහවුරු කරගෙන නොතිබුණි. මීට අමතරව රාජ්‍ය සේවයේ නිලධාරින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) නිවාඩු ලේඛන යාවත්කාලින නොකිරිම, නිවාඩු ඉල්ලුම් පත්‍රවල අඩුපාඩු හා වැටුප් රහිත නිවාඩු අයකර නොගැනිම.

(ඈ) දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලයේ 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ගෙවන ලද බාහිර උපදේශක දීමනා මුදල වන රු.3,653,380 ක් අදාල නිලධාරින්ගේ නමට චෙක්පත් ලිවීම සිදු නොකර, විදුහල්පතිගේ නිල නාමයට චෙක්පත් ලියා මුදල් කර අදාල නිලධාරින්ට ගෙවා තිබුණි. මීට අමතරව භාණ්ඩ සේවා මිලදි ගැනීම් හා ඉන්ධන සඳහාද විදුහල්පතිගේ නමට චෙක්පත් නිකුත් කර තිබුණි.

(ඉ) අම්පාර තාක්‍ෂණ විද්‍යාලයේ වෘත්තිය මාර්ගෝපදේශන අංශය 2014 වර්ෂයට අදාලව සැලසුම් කරන ලද වැඩසටහන් 27න් 09 ක් පමණක් පවත්වා තිබුණි.

(ඊ) දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලයේ වාහනයක මයිලෝ මීටරය කි.මී. 203,691 එකවර වෙනස් කර තිබුණි. ධාවන සටහන්වල මුල් පිටපත් හා අනු පිටපත්වල වෙනස්කම් පැවැතුණි.

**4.5.2 විගණන හා කළමනාකරණ කමිටුව**

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙනුවෙන් අමාත්‍යාංශයේ පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු තීරණ 5ක් සම්බන්ධයෙන් විධිමත් පියවර ගෙන නොතිබුණි.

**4.6 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දෙපාර්තමේන්තුවේ පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතව පැවතියේද යන වග | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) | ගොඩනැගිලි | 01 | ඌන උපයෝජිතව | වර්ෂ 4 ට වැඩි |
| (ii) | නිල නිවාස | 01 | ඌන උපයෝජිතව | වර්ෂ 4 ට වැඩි |
| (iii) | පරිගණක | 31 | නිෂ්ක්‍රීය | වර්ෂ 1ට වැඩි 4ට අඩු |
| (iv) | වෙනත් වත්කම් | 64 | ඌන උපයෝජිතව | වර්ෂ 4 ට වැඩි |

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇඹිලිපිටිය සහ අනුරාධපුර කාර්මික හා තාක්ෂණ විද්‍යාලවල සමහර භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. මේ නිසා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ii) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛනය අනුව විද්‍යාල 12 ක තොරතුරු එහි ඇතුළත්ව නොතිබුණු අතර විද්‍යාල 9 ක එම කාර්යයන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නිමකර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත ලබා දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව/ඒකක ගණන/ප්‍රමාණය | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම රු. | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) ඉඩම් | අක්කර 30 | විශ්ව විද්‍යාල විද්‍යායතනය | 25,000,000 | තොරතුරු ලබා දී නැත |
| | පර්චස් 110 | ක්‍රීඩා අමාත්‍යාංශය | | |
| | අක්කර 07 | ඌව වෙල්ලස්ස ක්‍රීඩාංගනය | | |
| | අක්කර 08 | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | | |
| | අක්කර 1.5 | විවෘත විශ්වවිද්‍යාලය | | |
| | පර්චස් 9.5 | ජී.ජී ප්‍රේමාවතී මිය | | |
| | අක්කර 01 | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය | | |
| (ii) ගොඩනැගිලි | 02 | ජාතික මැණික් හා ස්වර්ණාභරණ ආයතනය | 1,155,000 | |
| (iii) වෙනත් වත්කම් මානව සම්පත් | 01 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | | |

## 4.7 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| 1990 අංක 20 දරන තෘතියීය හා වෘත්තිය අධ්‍යාපන පනත | සියළුම කාර්මික සහ වෘත්තිය අධ්‍යාපන පුහුණු ආයතන, තෘතීයික හා වෘත්තිය කොමිෂන් සභාවේ ලියාපදිංචි විය යුතු වුවත්, තාක්ෂණ විද්‍යාල 15 ක් ලියාපදිංචි වලංගු කාලය අවසන් වී තිබුණද ලියාපදිංචිය අළුත් කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 104(4) | දෙපාර්තමේන්තුවේ වාහනයට සිදු වී තිබුණු අලාභහානි පිළිබඳ පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛ** | |
| දින රහිත අංක 01/2013 දරන චක්‍රලේඛය | මරදාන තාක්ෂණ විද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයට අයත් නිලධාරින් සතියකට පැය 25 ක් ඉගැන්වීමේ කටයුතුවල නිරත විය යුතු වුවත්, දේශකයන් 21 දෙනෙකු නියමිත දේශන පැය ප්‍රමාණය ඉගැන්වීමේ කටයුතුවල නියැලී නොතිබුණි. |

### 4.8 විදේශාධාර ව්‍යාපෘති

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ මාතර, කෑගල්ල, මඩකලපුව කාර්මික විද්‍යාලවල ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 03 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව ඉහත සඳහන් ප්‍රතිසංස්කරණ වෙනුවෙන් ලබා දී තිබුණු උපදේශවලින් අඩුපාඩු 13 ක් හඳුනාගෙන තිබුණි. 2015 පෙබරවාරි 19 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව උපදේශක සේවය ලබා දී තිබුණු උපදෙස්වලින් පාඩු සිදුවී තිබුණු නිසා තාවකාලික ලෙස අත්හිටවන ලද එම සේවය 2015 පෙබරවාරි 04 දින සිට අවසන් කර තිබුණි. මෙම සේවාව සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.2,012,875 ක් වැය කර තිබුණි.

(ආ) ඉහත සඳහන් ප්‍රතිසංස්කරණ සඳහා රුපියල් මිලියන 149 ක ප්‍රතිපාදන සළසා තිබුණත් ඉන් රු. මිලියන 101 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව අපේක්ෂිත කාර්ය වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 32 ක පමණ ප්‍රගතියක් ළගා කර ගෙන තිබුණි.

## 4.9 කාර්යසාධනය

-------------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්‍ෂණය පහත දැක්වේ.

අධ්‍යයන අංශයෙන් ලබාගත් සංඛ්‍යා ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේදී අර්ධ කාලින/සන්ධ්‍යා පාඨමාලා හැදෑරූ සිසුන්ගෙන් රු.10,406,500 ක් පාඨමාලා ගාස්තු ලෙස අයවිය යුතු වුවත්, දෙපාර්තමේන්තුවට තාක්‍ෂණ/කාර්මික විද්‍යාලවලින් එවන ලද වාර්තා අනුව රු. 9,418,100 පාඨමාලා ගාස්තු ප්‍රමාණයක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව රු.988,400 ක වෙනසක් පැවැතුණි.

## 4.10 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිගණක 150 ක් හා යූපීඑස් 150 ක් මිලදී ගැනිම සඳහා රු.69,216 ක් වැය කර පුවත්පත් දැන්වීම් පල කර තිබුණි. 2013 දෙසැම්බර් 03 දින වන විට ආයතන 17 ක් වෙත ලංසු ඉල්ලුම්පත් ලබා දී තිබුණු අතර ඉන් 12 දෙනෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. විගණන පරික්ෂණ දිනය වූ 2014 සැප්තැම්බර් 26 දින වන විටත් එම ලංසු විවෘත කර නොතිබුණි. 2014 පෙබරවාරි 18 දින විෂය ලිපිකරුගේ සටහන අනුව ලංසු විවෘත කිරිම අමාත්‍යාංශයේ වාචික උපදෙස් හා අධ්‍යක්‍ෂ ජනරාල්ගේ දැනුම් දීම මත අත්හිටුවා තිබුණි.

(ආ) වාහනයක 2011 මාර්තු 18 දින එන්ජිම අකර්මන්‍යවීම හා 2011 ජුනි 05 දින බෙලිඅත්ත කාර්මික විද්‍යාලයේ නවතා තිබියදී පසුපස වීදුරුව බිදීයාම යන සිදුවීම් දෙක සම්බන්ධයෙන් රු.1,973,825 ක් වැය කර අළුත්වැඩියාව සිදු කර තිබුණි. එම අලාභහානිය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනිමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් අවසරයක් ලබා නොගෙන මෝටර් කෝච් වර්ගයේ වාහනය අධ්‍යක්ෂවරයා විසින් පැදවීමේදී අනතුරට ලක්වීම නිසා රු.307,405 ක අලාභහානියක් සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම අලාභහානිය අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වාහනයක එන්ජිම ක්‍රියා විරහිතවීම සම්බන්ධයෙන් අවසාන නිගමනයකට එළඹීමට එම දෝෂය සිදුවී වර්ෂ $2^1/_2$ කට වැඩි කාලයක් ගත වී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිගමනයකට එළඹීමට දෙපාර්තමේන්තුව අසමත් වී තිබුණි.

(ඉ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරිමේ දෙපාර්තමේන්තුවේ කාර්මික විද්‍යාල මෙහෙයුම් අත්පොතේ 7.13(I) අනුව සියළුම පාඨමාලා ප්‍රතීතනය කළ යුතු වුවද, 2014 ඔක්තෝබර් 31 දින වන විට ජාතික වෘත්තිය සුදුසුකම් පාඨමාලා 21 න් පාඨමාලා 5 ක් හෙවත් සියයට 24 ක ප්‍රමාණයක් පමණක් ප්‍රතීතනය කර තිබුණි.

(ඊ) ඉංජිනේරු සැලැසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතික පත්‍ර පාඨමාලාව පවත්වාගෙන යනු ලබන නමුත් එම පාඨමාලාව ප්‍රතීතනය කර නොතිබුණු කාර්මික/තාක්ෂණ විද්‍යාලවල 2013 අධ්‍යයන වර්ෂයට අදාළව පවත්වනු ලැබූ විභාගයෙන් පළමුවර සිසුන් 392 ක්ද, දෙවනවර හා තෙවනවර එකතුව සිසුන් 188 ක් ද වශයෙන් මුළු සිසුන් 580 ක් සමත් වී තිබුණි. ඉන් පාඨමාලාව ප්‍රතීතනය නොකරන ලද කාර්මික විද්‍යාල 12 ක සිසුන් 254 කට තෘතියික වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කර නිකුත් කරනු ලබන සහතික පත්‍ර ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි. ඒ අනුව පිළිගත් සහතිකපත්‍ර අහිමි සිසුන් ගණන සමත් මුළු සිසුන්ගෙන් සියයට 44 ක ඉහළ මට්ටමක පැවතිණි. එකම විෂය මාලාව යටතේ පාඨමාලා හැදැරූ සිසුන් අතරින් පාඨමාලා ප්‍රතීතනය කරන ලද කාර්මික විද්‍යාල සිසුන් ජාතික වෘත්තීය සුදුසුකම් සහිත පිළිගත් සහතික පත්‍ර ලබා ගන්නා විට, පාඨමාලා ප්‍රතිතනය නොකරන ලද කාර්මික විද්‍යාල වල පවත්වන එම පාඨමාලා හැදැරූ සිසුන්ට දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ සහතිකයක් ලැබීම මගින් එම ශිෂ්‍යයන්ට යම් අසාධාරණයක් සිදු වී තිබුණි.

## 4.11 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,313 | 533 | 780 | - |
| (ii) තෘතියික මට්ටම | 144 | 18 | 126 | - |
| (iii) ද්විතියික මට්ටම | 1,272 | 842 | 430 | - |
| (iv) ප්‍රාථමික මට්ටම | 1,167 | 919 | 248 | - |
| (v) වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 10 | - | 10 |
| **එකතුව** | **3,896** | **2,322** | **1,584** | **10** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 වර්ෂයේදී ගොඩනැගිලි උපදේශකවරයෙකු ලෙස පත්වීමක් ලද නිලධාරියෙකු ඔහුගේ පත් කිරීම් හා උසස් කිරීම්වලට අදාල සුදුසුකම් විධිමත් පරිදි තහවුරු කර නොගෙන ඔහු වෙත උසස්වීම් ලබා දී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ නියමයන්ට පටහැනිව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් බඳවා ගැනීමට 1989 මැයි 26 දිනැති අංක 560 දරන ගැසට් පත්‍රයේ නිවේදනය පලකර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය අනුව උපදේශක තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පස් වසරකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතු වුවත්, නිලධාරීන් දෙදෙනෙකුගේ පුද්ගලික ලිපිගොනු අනුව ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් විසින් "මෙම නිලධාරීන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ අවස්ථාවේදී නියමිත සුදුසුකම් පරීක්ෂා කර බඳවාගෙන ඇති බව නිගමනය කරන අතර ඊට අදාල සියළු සහතික පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුළත්ව නොමැති බැවින් මේ සඳහා නිශ්චිත පිළිතුරක් ලබාදිය නොහැකි බව" බව විගණනය වෙත දන්වා තිබුණි.

## 5 ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය

-----------------------------------------------

### 5.1 විගණන විෂය පථය

---------------------

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සමාලෝචිත වර්ෂය සඳහා වූ විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ විදුහල්පතිවරයා වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

### 5.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 5.3 විගණකගේ වගකීම

-------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට

අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 5.4 ආයතනය සංස්ථාගත කිරීම

2005 අගෝස්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/ 0994 / 029 / 013 ට අනුව ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය විධිමත් ලෙස සංස්ථාගත කරන තෙක් මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ අනන්‍යතාවය මත තවදුරටත් පවත්වාගෙන යාමට ඉඩදිය යුතු යැයි තීරණය කර තිබුණි. එම තීරණය ලබාදී වර්ෂ 11 ක් ඉක්ම ගොස් තිබියදීත් ආයතනය සංස්ථාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 5.6.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 5.6 මූල්‍ය ප්‍රකාශන

### 5.6.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 5.6.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**5.6.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

5.6.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ සේවක කණ්ඩායම් 02 ක් සඳහා ක්‍රම 02 ක් යටතේ සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය ගණනය කර තිබුණත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව කාර්ය මණ්ඩල ප්‍රතිලාභ වියදම් පිළිබඳව අතිරේක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව පූර්ව කාල පරිච්ඡේද වැරදි, නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු නොකර, රු.47,088,488 ක් හා රු.29,989 ක් පිළිවෙළින් සංචිත ගිණුම්වලට හා සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබුණි.

**5.6.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙන ලද අත්තිකාරමක් පියවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී මුදලින් ලද රු.35,500 අත්තිකාරම් ගිණුම බැර කිරීම වෙනුවට ආදායම් ගිණුම බැර කර තිබීම නිසා අත්තිකාරම් ගිණුමේ ශේෂය හා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) බාහිර ආයතනයක් වෙත ගෙවන ලද රු.44,520 ක අත්තිකාරම් එම ගිණුමේ සටහන් කිරීම වෙනුවට වියදමක් ලෙස සටහන් කිරීමත්, පියවීමේදී වියදම් ගිණුමට නැවත හර කිරීමත් බැර සටහන අත්තිකාරම් ගිණුමෙහි සටහන් කිරීමත් හේතුවෙන් අත්තිකාරම් ගිණුමේ හා අදාල වියදම් ගිණුමෙහි ශේෂ එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

**5.7 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.14,328,966 ක් වූ පහත සඳහන් ගිණුම් විෂයයන් 03 ට අදාලව ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| ගෙවිය යුතු වියදම් | 11,149,826 | කාල විශ්ලේෂණ හා විස්තරාත්මක උපලේඛන |
| ණයහිමි ශේෂ 21 ක් | 3,089,019 | ගෙවිය යුතු බවට තහවුරු සාක්ෂි (බිල්පත්) |
| වාහන අළුත්වැඩියා වියදම | 90,121 | බිල්පත |

## 5.8 ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,199,935 ක ණය ශේෂ අයවීමට පැවති අතර ඉන් රු.3,018,576 ක ණය ශේෂ වර්ෂ 01 ට වඩා වැඩි කාලපරිච්ඡේදයකට අදාල විය.

## 5.9 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 188 (2) | 2006 හා 2007 වර්ෂවලට අදාල තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ එකතුව රු. 35,036 ක මුදල් ඇනවුම් ශේෂ නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි. |
| **(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | |
| (i) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 2014 ඔක්තෝබර් 17 දිනැති අංක PFD/RED/03/03/01 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය හා 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එකතුව රු. 6,383,077 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණන දිනය වූ 2015 සැප්තැම්බර් 02 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 5.10 මූල්‍ය සමාලෝචනය

### 5.10.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.28,776,819 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.31,919,207 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,142,388 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන භාණ්ඩාගාර ප්‍රදාන රු.7,288,000 කින් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 5.10.2 මෙහෙයුම් සමාලෝචනය

**කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් පූර්ණකාලීන පුහුණු පාඨමාලා 10 ක් පවත්වා තිබුණු අතර ඉන් පාඨමාලා 2 ක් ප්‍රතීතනය කර නොතිබුණි.

## 5.11 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.1,103,200 ක් වූ පරිගණක ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් 2010 හා 2011 වර්ෂවලදී රු.591,100 ක් වැයකර තිබුණි. එහි පැවති අඩුපාඩු හා දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම පද්ධතිය

ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. ඒ සඳහා කළමනාකරණය විසින් නිසි අවධානය යොමු නොකිරීම හේතුවෙන් වැයකළ මුදල නිෂ්ඵල වී තිබුණි.

(ආ) 2014 ජුනි මාසයේදී රු.1,517,824 ක් වටිනා පුහුණු උපකරණයක් මිලදී ගැනීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත අත්තිකාරම් ගෙවා තිබුණද, විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 29 දින වන විටත් එම උපකරණය ආයතනය වෙත සපයා නොතිබුණි. එම පුහුණු උපකරණ නිසි වේලාවට ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) සෘජුවම බැංකු ගිණුමට බැර කරන ලද එකතුව රු.848,398 ක් වූ කෙටිකාලීන පාඨමාලා ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කුමන වර්ෂවලට හා කුමන පාඨමාලාවලට අදාල ආදායම්ද යන්න හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ආයතනය විසින් බාහිර පාර්ශවයන්ගේ වාහන අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකර තිබුණි. එම අංශයන්හි කාර්යසාධනය මැනීමට පහසු වන පරිදි හා අදාල වියදම් අවශෝෂණය කර එහි මූල්‍ය ප්‍රතිඵලය පෙන්නුම් කෙරෙන පරිදි පිරිවැය ගිණුම්කරණ ක්‍රමවේදයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.12 මෙහෙයුම් අකාර්යක්ෂමතා

බැංකු ජංගම ගිණුම්වල රු.37,769,860 ක සාමාන්‍ය මුදල් ශේෂයක් පැවැතුණත්, එම මුදල් ආයතනයේ අරමුණු ඉටුකිරීමේ කාර්යයක හෝ සුදුසු ආයෝජනයක යෙදවීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

## 5.13 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ආයතනයේ රිදී ජුබිලිය සැමරීම සඳහා නිකුත් කරන ලද ලොතරැයි පත් අලෙවි කිරීමෙන් උපයන ලද රු.345,674 ක් ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා යොදා ගැනීමෙන් තොරව වර්ෂ 30 කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

## 5.14 කාර්ය මණ්ඩල පරිපාලනය

2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 252 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 223 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 34 ක් හා අතිරික්ත සංඛ්‍යාව 5 ක් වී තිබුණි.

## 5.15 පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදනය.

(ආ) අභ්‍යන්තර පාලනය.

(ඇ) ණයගැති හා අයවිය යුතු ආදායම්

## 6 තරුණ සුභසාධක අරමුදල

### 6.1 හැඳින්වීම

1990 මැයි 15 දිනැති අංක 610/2 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් 1990 අංක 01 දරන හදිසි අවස්ථා (දේපළ රාජසන්තක කිරීමේ) නියෝග මගින් රජයට පවරා ගත් සියලුම චංචල හා නිශ්චල දේපළ, තරුණයින්ගේ සුභසාධන කාර්යයට යොදවා ගැනීමේ අරමුණු ඇතිව 1993 මැයි 24 දිනැති අංක 768/1 දරන අති විශේෂ ගැසට් නිවේදනය පරිදි මහජන ආරක්ෂක පනතේ ( 40 වැනි අධිකාරිය ) 5 වැනි වගන්තිය යටතේ 1993 මැයි 21 දින අතිගරු ජනාධිපතිවරයා විසින් පැනවූ 1993 අංක 01 දරන තරුණ සුභසාධක අරමුදල නියෝග යටතේ තරුණ සුභසාධක අරමුදල පිහිටුවා තිබුණි. ඒ අනුව, 1993 ජූනි 29 දින සිට එම අරමුදල තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයාගේ විෂය පථයට ඇතුළත් කර තිබිණි.

කෙසේ නමුත්, 1994 අගෝස්තු මාසයේදී එතෙක් ක්‍රියාත්මකවූ මහජන ආරක්ෂක පනත අහෝසිවීමත් සමඟ එකී පනත යටතේ පනවා තිබුණු 1990 අංක 01 දරන හදිසි අවස්ථා (දේපළ රාජසන්තක කිරීමේ) රෙගුලාසි හා 1993 අංක 01 දරන තරුණ සුභසාධක අරමුදල රෙගුලාසි අක්‍රීය වී තිබුණි.

### 6.2 විගණන නිරීක්ෂණ

(අ) මහජන ආරක්ෂක පනත 1994 අගෝස්තු මාසයේදී අහෝසිවීම මත අරමුදල අක්‍රීයභාවයට පත් වී තිබුණු අතර අරමුදලට අදාල ඇවර කිරීමේ ගිණුම් සමාලෝචිත වර්ෂය නිමවන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අරමුදලේ නිශ්චල දේපලවල අයිතිය ජාතික තරුණ සේවා සභාවට පැවරීමට නීත්‍යානුකූල බාධාවක් නොමැති බව 1999 අගෝස්තු 09 දිනැති ලිපිය මගින් නීතිපතිවරයා විසින් දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය නිමවන විටත් එම දේපලවල අයිතිය ජාතික තරුණ සේවා සභාව වෙත විධිමත් පරිදි පවරා නොතිබුණි. එමෙන්ම අරමුදල සතුව තිබූ රන් භාණ්ඩ හා මුදල් තැන්පතු නිරවුල් නොවීම පිළිබඳ 2012 වර්ෂයේ විගණන වාර්තා මගින් පෙන්වාදුන් කරුණු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය නිමවන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 7 ජාතික යෞවන තිළිණ අධිකාරිය

-------------------------------------

**පිහිටුවීම**

---------

1979 අංක 11 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුකූලව 1979 ජූලි 25 දින හා 1980 සැප්තැම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ජාතික යෞවන තිළිණ අධිකාරිය පිහිටුවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, මහ බ්‍රිතාන්‍යයේ එඩින්බරෝහි ආදිපාදවරයා විසින් 1956 වර්ෂයේදී පිහිටවූ එඩින්බරෝ ආදිපාද තිළිණ ප්‍රදාන යෝජනා ක්‍රමය අනුගමනය කරමින් 1980 වර්ෂයේදී යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය යටතේ ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිතව පිහිටවූ මෙම අධිකාරිය 2014 පෙබරවාරි 25 දිනැති අංක 14/0299/539/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ජාතික යෞවන තිළිණ අධිකාරිය, ජාතික යෞවන තිළිණ අංශය ලෙස ජාතික තරුණ සේවා සභාව යටතට ගෙන තිබුණි.